ලංකා ධීවර සංස්ථාව - 2019
----------------------------------
ලංකා ධීවර සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------------------------
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්ති ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම්, හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩල වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 මූල්‍ය ප්‍රකාශන 2019 නොවැම්බර් 20 දිනත් 2017 මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 08 දිනත් ඉදිරිපත් කර තිබූ අතර 2018, 2019, 2020 හා 2021 යන වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

02. විගණන නිරීක්ෂණ
--------------------

2.1 නීති රීති රෙගුලාසි හා කළමනාකාරීත්ව තීරණ වලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) මහා භාණ්ඩාගාරයෙන් ලබාගන්නා මුදල් පරිහරණය කිරීම සම්බන්ධයෙන් 2016 සැප්තැම්බර් 26 දින පැවති සභාපති හා ස්වේච්ඡා විශ්‍රාම වන්දි ගණනය කිරීමේ කමිටුව සමඟ පැවැත්වූ 2016 සැප්තැම්බර් 26 දිනැති සාකච්ඡාවේදී වූ තීරණ අනුව විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබාගන්නා මුදල් වෙනමම ගිණුමක් වෙත බැර කරන ලෙසත්, එහි වගකීම වැඩබලන මුදල් කළමනාකාර වෙත භාර දෙන ලෙසත්, ක්‍රියාත්මක කිරීමට සාමාන්‍යාධිකාරීට උපදෙස් ලබා දී තිබුණද 2016 වර්ෂය තුළදී ලැබූ රු.මිලියන 379ක මුදල සම්බන්ධයෙන් වෙනනම බැංකු ගිණුමක් විශ්‍රාම වන්දි වෙනුවෙන් | පිළිගනිමි. මෙම කරුණ ඇතුළුව ආයතනයේ මූල්‍ය රෙගුලාසි සහ අනිකුත් අභ්‍යන්තර චක්‍රලේඛන නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වැඩ බලන මුදල් කළමනාකාරිණිය මෙන්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් (වැ.බ සාමාන්‍යාධිකාරී) වැඩ තහනම් කර අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන භාණ්ඩාගාර උපදෙස් හා නිසි ක්‍රමවේදයකට අනුව අදාල අරමුණු සඳහාම යොදා ගැනීමට කළමනාකරණ මණ්ඩල කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව උපදෙස් ප්‍රකාරව වැඩබලන මුදල් කළමනාකරු කටයුතු කර නොතිබූ අතර, සාමාන්‍යාධිකාරී විසින් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ බවද නිරීක්ෂණය විය. | | |
| ආ) 2019 අගෝස්තු 31 දිනට සේවක අර්ථ සාධක අරමුදලට හිඟ දායක මුදල් රු.174,927,250 ක් සහ සේවක භාරකාර අරමුදලට හිඟ දායක මුදල් රු. 15,520,274 ක් සහ අධිභාර මුදල් රු. 82,367,893 ක් සහ රු. 7,663,632 ක් පිළිවෙලින් ගෙවිය යුතු වුවත් මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයෙහි අ 3.1 සිට 3.5 දක්වා වූ ඡේදවල දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | පිළි ගනිමි.පසුගිය වර්ෂ පුරාම ලංකා ධීවර සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම හේතුවෙන් මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීමේ මූල්‍ය දුෂ්කරතාවය පැන නැගුණි. හිඟ ශේෂ පියවීමට අදාල යෝජනාවක් රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා මඟින් ඉදිරි අයවැය යෝජනාවක් මඟින් හෝ ඉදිරිපත් කර මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන පියවා දැමීමට අපේක්ෂා කරන අතර වර්තමානයේදී අදාල දායක මුදල් මාසිකව ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත. | ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1964 ඔක්තෝබර් 01 දිනැති අංක 14/186 දරණ සහ 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් නියම කරන ලද ව්‍යාපාරික කාර්යයන් අතුරින් සංස්ථාව විසින් ඍජුවම හෝ ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ මෙහෙයුම් වල නිරතවීම, මත්ස්‍ය පිරිසැකසුම් වල නිරත වීම, බලයලත් ඒජන්තවරු මාර්ගයෙන් මසුන් තොග සහ සිල්ලර වෙළඳාම් කිරීම, මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සහ විදේශීය වෙළඳපොලවල මසුන් විකිණීම යන කාර්යයන් ඉටු කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි.වගකිවයුතු නිළධාරීන් මේ වන විටත් ආයතනයෙන් ඉවත්ව ගොස් ඇති අතර වර්තමානයේ නිළධාරීන් මෙන්ම කළමනාකාරිත්වයද නව පත්කිරීම් වේ. එනමුදු 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්ම, 2020/2021 වර්ෂ සඳහා අයවැය ලේඛණය, ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිරි මෙහෙයුම් කටයුතු සිදුකරමින් පවතී. අදාල සියළුම සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලබා ගෙන ඇත. | සංස්ථාවේ අරමුණු කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |
| (ඈ) පහත සඳහන් අඩුපාඩු සම්බන්ධයෙන් විධිමත් ඉදිරි පියවරයක් ගෙන නොතිබුණි.<br>i) 2003 ජුනි 02 දිනැතිඅංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.2 වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධනය ඇගයීම් කිරීම සඳහා ජොෂ්ය කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් නොකිරීම.<br>ii) අයිස් යන්ත්‍රාගාර 08 ම 2015 වර්ෂයේ රු.33,364,965 ක අලාභ ලබා තිබුණි. | විගණන විමසුම් 10 ක් සඳහා පමණක් පිළිතුරු සැපයීමට පවතී. අනිකුත් විගණන විමසුම් සඳහාද කඩිනමින් පිළිතුරු ලබා දීමට බලාපොරොත්තු වෙමු. 2014, 2015 වර්ෂයන්හි මෙන්ම පසුගිය වර්ෂයන්හිදීද විධායකයන්ගේ අලාභයන් පැවති නමුදු 2021 වර්ෂය තුල විධායකයන් ඒකාබද්ධ කර නව දිස්ත්‍රික්ක කාර්යාල පිහිටුවා ඇති අතර ඒ අනුව අලාභ ලැබූ විධායකයන් කිහිපයක් ලාභදායී තත්වයට පත්කර ඇත. දැනට අම්පාර, බදුල්ල, තංගල්ල, රත්නපුර, හම්බන්තොට, ගාල්ල, | සංස්ථාවෙහි වාර්ෂික කාර්ය සාධනය ඇඟයීම් කිරීම සඳහා ජේෂ්ඨ කළමනාකරණ කමිටුවක් පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| iii) ඉකුත් වර්ෂයේ විගණන විමසුම් 07 ක් හා සමාලෝචිත වර්ෂයේ විමසුම් 05 ක් සඳහාත් පිළිතුරු සපයා නොතිබුණි. | කළුතර යන විධායකයන් පමණක් අලාභදායීව පවතින අතර අනිකුත් විධායකයන් ලාභදායී තත්වයට පත්කොට ඇත. | |
| (ඉ) සංස්ථාව විසින් ණය පදනමින් බාහිර පාර්ශවයන්ට මසුන් අලෙවිය සිදු කරන්නේ නම් ඒ සඳහා ණය සීමාවන් පැනවිය යුතු බවත්, ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමටත්, බැංකු ඇපකර ලබා ගනිමින් බාහිර පාර්ශවයන් වෙත මසුන් නිකුත් කිරීම චක්‍ර ලේඛ රෙගුලාසි අනුව සිදු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2019 ජුනි මස 25 දින පැවති 1040 (I) වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ උපදෙස් ලබා දී නමුත් ඒ අනුව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | බාහිර පාර්ශවයන් වෙත මසුන් නිකුත් කිරීම චක්‍රලේඛ රෙගුලාසි අනුව හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා උපදෙස් අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුයි. |

## 2.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අත්‍යවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදුකිරීමට ප්‍රධාන කාර්යාලය තුල ඉදිකර ඇති මත්ස්‍ය සැකසුම් ඒකකය අළුත්වැඩියා කිරීම සඳහා රු. 65,000,000 ක් 2017 පෙබරවාරි 20 දින සංස්ථාවට ලබා දී තිබුණි.එයින් ඍජු වියදම් සඳහා රු.24,230,565ක් වැය කර තිබූ අතර ප්‍රසම්පාදන කටයුතු නිසි ක්‍රමවේදයෙන් තොරව සිදුකර තිබීම හේතුවෙන් ඉදිකිරීමේ කටයුතු අවසන් නොකර අතරමඟ නවතා දමා තිබූ බැවින්, අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සිදු කළ යුතු අතර 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 26 හා 28 වගන්ති අනුව ඉදිකිරීම් වැඩ කරගෙන යාම, නිර්මාණය කිරීම, අවශ්‍ය කොන්ත්‍රාත් ලේඛන හා ඉදිකිරීම් අධීක්ෂණය යනාදී කාර්යයන් කළ යුතුය. |
| (ආ) සංස්ථාව විසින් එම මත්ස්‍ය සැකසුම් ඒකකයේ පැරණි වහලයෙහි ඇස්බැස්ටස් ෂීට් ඉවත්කර නව ෂීට් සෙවිලි කිරීමට රු.3,732,498 ක් වියදම් දරා තිබුණි. පැරණි ෂීට් ඉවත් කිරීම සිවිල් ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයකින්ද තොරව සිදුකර තිබූ අතර පැරණි | අදහස් දක්වා නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් විමර්ශනයක් කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඇස්බැස්ටස් ෂීට් නැවත ගබඩාවට භාරදී නොතිබුණු අතර එම ෂීට් වැඩ භූමියේද නොතිබුණි. | | |
| (ඇ) 2019 සැප්තැම්බර් 02 දින මත්ස්‍ය සැකසුම් ඒකකය භෞතිකව පරීක්ෂා කිරීමේදී අළුතින් අතුරා තිබුණු ඇස්බැස්ටස් ෂීට් 155 ක් පුපුරා ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර වර්ෂා ජලය කාන්දු වීම හේතුවෙන් සිවිලිමේ පැවැත්මද අවධානම් තත්ත්වයක පවතින බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | වගකිවයුතු නිළධාරීන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) මෝදර මත්ස්‍ය සංකීර්ණයේ ක්‍රියාත්මකව පවත්නා අයිස් නිෂ්පාදනාගාර සඳහා විද්‍යුත් ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 10ක් සංස්ථාව වෙත 2016 දෙසැම්බර් මස ලබා දී තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනවශ්‍ය ලෙස ප්‍රමාද වීම නිසා ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර මිලදී ගෙන නොතිබූ බැවින් නිෂ්පාදනාගාරයේ කාර්යක්ෂමතාවය අවම වීම නිසාආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලය හා ඉහළ කළමනාකරණය විසින් සංස්ථාවේ කටයුතු කාර්යක්ෂම කර ආදායම වර්ධනය කරගැනීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ලංකා ධීවර සංස්ථාව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ලාභ උපයන ආයතනයක් බවට පත්කිරීම සඳහා දේශීය හෝ විදේශීය පාර්ශවයන් සමඟ බද්ධ ව්‍යාපාරයකට අවතීර්ණය වීම සඳහා 2016 අගෝස්තු 23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.එම තීරණය ප්‍රකාරව 2017 ජනවාරි 26 දින අමාත්‍ය මණ්ඩල සාකච්ඡා විසඳුම් කමිටුවක් පත්කර තිබූ නමුත්විගණනය සිදුවන 2021ජූලි වන විට අවුරුදු 04 ක් සහ මාස 06 ක් පමණ ගතවී තිබුණද සාකච්ඡා කමිටුව රැස් වී නොතිබුණි. එසේම 2017 ජනවාරි 26 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුවක්ද ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පත්කර තිබුණි. එසේ වුවත් අමාත්‍ය මණ්ඩලය පත්කල සාකච්ඡා විසඳුම් කමිටුව (CANC) සහ ව්‍යාපෘති කමිටුව (PC)පත්කර විගණනය සිදුවන දිනට | අදහස් දක්වා නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරිමට කටයුතු කර අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| වර්ෂ 04 කට අධික කාලයක්ගතවී තිබුණද ලංකා ධීවර සංස්ථාව රාජ්‍ය පෞද්ගලික හිමිකාරීත්වය යටතේ බද්ධ ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාමට දේශීය හෝ විදේශීය ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අවම වශයෙන් යෝජනා කැඳවීම් හෝ සිදුකර නොතිබූ අතර ඊට අදාල ප්‍රසම්පාදන කටයුතුද අතරමග නවතා දමා තිබුණි. | | |
| (ඊ) කොරියානු සමාගමක් වන ෆොන්ටස් ඕෂන් හෝල්ඩින්ග්ස් සමාගම විසින් ලංකා ධීවර සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාරයක් ලෙස මසුන් සැකසුම් කර අපනයනය කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික ව්‍යවසායක් ආරම්භ කිරීමට ගිවිසුම්ගතවීම සඳහා 2016 මැයි 19 දින සිට උත්සාහ කර තිබුණද ඊට අදාල නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය සහ බද්ධ හවුල්කාර සමාගමේ යෝග්‍යතාවය නිසිලෙස ඇගයීම් නොකිරීම හේතුවෙන් ෆොන්ටස් ඕෂන් හෝල්ඩින්ග්ස් සමාගම සමඟ ආරම්භ කිරීමට සැලසුම්කර තිබූ බද්ධ ව්‍යාපාරයද අසාර්ථකවී අතරමඟ නවතා දමා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නියමිත සැලසුමකට අනුව කටයුතු කර නව ආයෝජන තුලින් සංස්ථාවේ ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට ක්‍රියා කල යුතුය. |
| (උ) සංස්ථාව විසින් 2016 මාර්තු 18 දිනැති 2/2016 දරණරාජ්‍යව්‍යාපාරචක්‍රලේඛය පරිදි අතිරික්තව පැවති සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවට, විශ්‍රාම යාම සඳහා සෑම නිළධාරියෙකුට අවස්ථාවදීමට කටයුතු කිරීම නිසා සංස්ථාවෙහි දෛනික ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රධාන තනතුරුද පුරප්පාඩු වී තිබුණි. මෙම නිසා කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය ධාරිතාවය සහිත නිළධාරීන් නොමැති වීම හේතුවෙන් සංස්ථාව ලාභදායී වාණිජ ව්‍යාපාරයක් බවට පත් කිරීමේ අරමුණට ලගා වීමටමෙකී සැලසුමකින් තොරව විශ්‍රාම ගැන්වීම් හේතු වී තිබුණි. | පිළිගනිමි.මෙම ක්‍රියාවලිය ඉතා කඩිනමින් සිදු කළ යුතුව තිබූ නිසා මෙසේ හඳුනාගත් පිරිස් විශ්‍රාම ගැන්වීම සිදුකිරීමට නොහැකි විය. පුරප්පාඩු වූ සියළු තනතුරු සඳහා නිළධාරීන් පත්කරනු ලැබුවද නොයෙකුත් කරුණු සහ තත්වයන් පාදක කර තනතුරු පුරප්පාඩු වීම් සිදු වී ඇත. ඉතා කඩිනමින් මෙම ගැටළුන් නිරාකරණය කර ලංකා ධීවර සංස්ථාව තරඟකාරී ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලිය මඟින් ලාභදායී වාණිජ රාජ්‍ය සංස්ථාවක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වෙමු. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කල යුතුයි. දැනට පුරප්පාඩුව පවතින ප්‍රධාන තනතුරු සඳහා සුදුස්සන් පත්කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) ධීවර සංස්ථාව ස්ථාපිත කිරීමේදී සංස්ථාව වෙත පැවරී තිබූ ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් ඉදිකිරීම සහ පවත්වාගෙන යාම, ධීවර ආම්පන්න ආනයනය කිරීම සහ විකිණීම, ධීවර යාත්‍රා ඉදිකිරීම, ධීවර යාත්‍රා සඳහා නඩත්තු පහසුකම් සැපයීම, ධීවරයන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍ය උපකරණ නිපදවා අලෙවිකිරීම යන ව්‍යාපාරික කාර්යයන් ධීවර අමාත්‍යාංශය යටතේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,සීමාසහිත සී - නෝර් පදනම හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන ස්ථාපිත කිරීමත් සමඟ එම ආයතනවලට පැවරී තිබූ නමුත් ඒ අනුව සංස්ථාවේ ව්‍යාපාරික කර්තව්‍යයන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | දේශීය වෙළඳපොළ තුළ අවශ්‍ය ප්‍රමාණයට මසුන් වර්ග (තලපත්/ කොප්පරා) නොමැති වීම නිසා මසුන් ආනයනය කිරීමේ කාර්යයන් සඳහා සෘජු ලෙස සම්බන්ධවීමට අවශ්‍ය කටයුතු නව කළමනාකාරිත්වය යටතේ රේඛීය අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත සිදු කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වෙමු.<br><br>දැනට ධීවර සංස්ථාව මෙහෙයුම් කටයුතු ප්‍රතිව්‍යුහගත කරණය කර නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර යම් යම් ව්‍යාපෘති හවුල්කර ව්‍යාපාර ලෙස ආරම්භ කිරීමට අවශ්‍ය මූලික පියවරයන් දැනටමත් ගෙන ඇත.උදා - ගාල්ල අයිස් යන්ත්‍රාගාරය | සංස්ථාවේ ව්‍යාපාරික කර්තව්‍යයන් සංශෝධනය කර පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) පේසාලේ පිහිටි සංස්ථාවට අයත් අක්කර 03 රූඩ් 01 පර්චස් 13.9 ක් වූ ව්‍යාපාරික ස්ථානය 2016 ඔක්තෝබර් 17 දින ප්‍රසම්පාදන කමිටුව විසින් මාසික කුලිය 150,000 ක් ලෙස තීරණය කර තිබුණ ද මාසිකව රු.130,000 බැගින් බදු දීම නිසා 2016 දෙසැම්බර් 14 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 36 ක් සඳහා රු.720,000 ක අලාභයක් සිදු වී තිබුණි. මෙයට අදාල කල්බදු ගිවිසුමේ 06 වන වගන්තිය අනුව ගිවිසුම ආරම්භයේදී වර්ෂයක කාලසීමාවක් සඳහා රු.500,000 ක බැංකු ඇපකරයක් සංස්ථාවට ලබාදිය යුතු අතර වාර්ෂිකව යාවත්කාලීන කරගත යුතු වුවද ඒ අනුව කටයුතු කරද නොතිබුණි.එසේම භූමිය සහ බදු ඉඩම වෙන්කිරීමක් සිදුකර නොමැතිවීම හේතුවෙන් අක්කර 20 යි රූඩ් 01 පර්චස් 15 ක් වූ ඉඩම් ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට අනිසි පරිහරණය සඳහා අවස්ථාව සලසා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව අලාභ සිදු නොවන ආකාරයට කටයුතු කළ යුතුයි. |
| (ඒ) ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ ශීතාගාරයට අයත් කන්ඩෙන්සර් දෙක රු. 313,103 | ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ පැරණි කන්ඩෙන්සර් 02 යකඩ | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නිර්දේශ අනුව කටයුතු |

| | | |
|---|---|---|
| කට පැරණි යකඩ ලෙස 2018 මැයි 16 දින විකුණා තිබුණු නමුත් ඒ සඳහා මුදල් රෙගුලාසි 770 හා 771 අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද මෙම භාණ්ඩ සඳහා තාක්ෂණික දැනුමැති ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගෙන නොතිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාගෙන නොතිබුණි. | සඳහා විකිණීම සම්බන්ධයෙන් අභ්‍යන්තර වශයෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. නව කන්ඩෙන්සර් යන්ත්‍ර දෙක සම්බන්ධයෙන් පවතින තාක්ෂණික කරුණු පදනම් කර ගනිමින් දැනට මෙම යන්ත්‍ර දෙක සඳහා ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇත. | කළ යුතු අතර පරීක්ෂණ වාර්තා අනුව වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) තවද එම අයිස් යන්ත්‍රාගාරයට කන්ඩෙන්සර් යන්ත්‍රයක් රු.6,368,750 බැගින් යන්ත්‍ර 2 ක් මිලදී ගැනීම සඳහාරු.2,547,500 ක අත්තිකාරම් 2018 අප්‍රේල් 12 දින ගෙවා කන්ඩෙන්සර් දෙක පද්ධතියට සම්බන්ධ කර තිබුණද අයිස් මිදීමට ගතවන කාලය වැඩිවීම, කන්ඩෙන්සරයේ ගෑස් හා ජලය කාන්දුවීමක් පැවතීම යන කරුණු මත ගුණාත්මක තත්ත්වයෙන් අඩු කන්ඩෙන්සරයක් සවිකර ඇති බව නිරීක්ෂණය විය.<br><br>තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව ඉල්ලුම්කරන ලද කන්ඩෙන්සර් යන්ත්‍ර 02 ඉල්ලුම්කරන ලද පිරිවිතරයන්ට අනුකූල නොවන්නේ නම් කිසිඳු කොන්දේසියකින් තොරව ප්‍රතික්ෂේප කරන බවත්, ලබා දී ඇති අත්තිකාරම් මුදල ලබාගන්නා බවත් නිර්දේශ සහිතව එකඟ වී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ පැරණි කන්ඩෙන්සර් 02 යකඩ සඳහා විකිණීම සම්බන්ධයෙන් අභ්‍යන්තර වශයෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. නව කන්ඩෙන්සර් යන්ත්‍ර දෙක සම්බන්ධයෙන් පවතින තාක්ෂණික කරුණු පදනම් කර ගනිමින් දැනට මෙම යන්ත්‍ර දෙක සඳහා ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නිර්දේශ අනුව කටයුතු කළ යුතු අතර පරීක්ෂණ වාර්තා අනුව වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඕ)සංස්ථාව විසින් 2017 මාර්තු 28 දින මෝදර ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමෙන් පර්චස් 117 .78 ක් සහ පර්චස් 30 ක භූමි කොටස් 02 ක්වසර 4 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට පිළිවෙලින් මාසික කුලිය රු.1,110,000 කට සහ රු.333,000 කට බදු දී තිබූ අතර 2019 අගෝස්තු 16 දින දක්වා මාස 08 ක හිඟ බදුකුලිය රු.5,487,450 ක් අයකර ගෙන නොතිබුණි. පෞද්ගලික ආයතනය විසින් තවත් පර්චස් 49.7 ක් අනවසරයෙන් භාවිතා කර තිබුණි. ඉන් පර්චස් 29.7 ක රජයේ තක්සේරුකරුගේ මාසික බදු තක්සේරුව රු.178,333 ක් විය. | අදහස් දක්වා නොතිබුණි. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| (ක) රු.1,500,000 ක් වූ පරිගණක ගිණුම්කරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමකට 2017 අගෝස්තු 31 දින කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. එසේ වුවත් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.2.1,5.3.11, 5.4.4 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුමක්, ලංසු සුරක්ෂණයක් සහ ගෙවූ රු.300,000 ක අත්තිකාරම් සඳහා බැඳුම්කරයක්ද ලබා ගෙන නොතිබුණි. මේ වන විට අවුරුදු 02 කට අධික කාලයක් ගතවී තිබුණද පරිගණකගත ගිණුම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | පිලිගනිමු. | පරිගණක ගත ගිණුම් පද්ධතියක් ස්ථාපිත කිරීමට කළමනාකරණයකටයුතු කළ යුතු අතර මූල්‍යමය අලාභ අය කර ගත යුතුය. |
| (ග) සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දින වන විට විධායකයන් 32 ක් හා වෙළඳසැල් 97 ක් පැවතුණි. 2019 දෙසැම්බර් 05 දින වන විට වෙළඳසැල් 88 ක් හා විධායක 21 ක් විය. මෙම විධායක වල ව්‍යාපාරික කටයුතු ප්‍රධාන කාර්යාල සමඟ සම්බන්ධ වීමට පරිගණකගත ගිණුම් පද්ධතියක් සංස්ථාව විසින් හඳුන්වා දී නොතිබුණි. | සියළුම විධායකයන් හා වෙළඳසැල් සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම පරිගණක පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වෙමි. | පරිගණක ගත ගිණුම් පද්ධතියක් ස්ථාපිත කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුයි. |

2.3 හඳුනාගත් පාඩු

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේ සිදුවී තිබූ රු. 2,558,028 ක් වටිනා ඇසුරුම් තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු ගබඩා අංශයෙහි කළමනාකරුට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයේදී එම ඌනතාවය අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට 2016 මාර්තු 09 වන දින තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විනය පරීක්ෂණ වාර්තා අනුව ඌණතාවය වගකිව යුතු නිලධාරීන්ගෙන් වහාම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

2.4 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලංකා ධීවර සංස්ථාව නමින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 4 කට අදාලව රු.304,514 ක් 2016 සිට මේ දක්වා අක්‍රීය බැංකු ගිණුම් බවට පත් වී ඇතත් එම ගිණුම් වසා දැමීමට අවශ්‍ය පියවර නොගැනීම නිසා සෑම මසකම බැංකු ගාස්තු අය කිරීම හේතුවෙන් එම ගිණුම් ශේෂ අයිරා ශේෂයක් ලෙසට පත් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය පියවර ගත යුතුයි. |

2.5 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ණයගැතියන් සඳහා ලබාදෙනු ලබන ණය සහන කාලය දින 45 ක් වුවද සංස්ථාව ඉදිරිපත් කල වයස් විශ්ලේෂණ උපලේඛනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ණය කාලය මාස දෙක ඉක්මවූ රු.140,432,424 ක ණයගැතියන් පැවති අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 66 ක් බව නිරීක්ෂණය විය. තවද වසර 2-5 අතර ශේෂය රු. 43,309,524 ක්ද වසර 05 ට වැඩි ශේෂය රු.65,569,605 ක්ද විය. එය පිළිවෙලින් මුළු ණයගැතියන්ගෙන් සියයට 20 ක් සහ සියයට 31 ක් විය. | අදහස් දක්වා නොතිබුණි. | ණයගැතියන් සඳහා දෙනු ලබන ණය සහන කාලය දින 45 නොඉක්ම වීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතු අතර හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) ණයහිමි වයස් විශ්ලේෂණය අනුව 2019 දෙසැම්බර් 31 දිනට මාස 03 ත් 06 ත් අතර රු.72,850,305 ක් මාස 06 ත් වසර 02 ත් අතර රු.50,967,824 ක් සහ වසර 02 ක ඉක්මවූ රු.82,842,846 ක නොපියවූ ණයහිමි ශේෂයන් විය. | අදහස් දක්වා නොතිබුණි. | මෙම ණයහිමි ශේෂ පිළිබඳ විමර්ශනයක් කර තවදුරටත් පියවීමට වගකීමක් නොමැති ණය ශේෂ නැවත ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය පවතින ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල නීති ප්‍රකාරව ගෙවා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) එකතුව රු. 293,521,703 ක් වූ ණයහිමියන්ගෙන් සහ එකතුව රු.191,845,870 ක් වූ ණයගැතියන්ගේ ශේෂ සනාථන ලිපි 2019 දෙසැම්බර් 31 | අදහස් දක්වා නොතිබුණි. | ණයගැති හා ණයහිමි ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| විගණනය වෙත ඉදිරිපත් නොවූ බැවින් එම ණයගැති සහ ණයහිමි ශේෂයන්ගේ පැවැත්ම පිළිබඳ තහවුරු කිරීමට නොහැකි විය. | | |
| (ඇ) සංස්ථාවේ සේවය කල නිළධාරියෙකුගේ පාරිතෝෂික හා ඒ සඳහා වන අධිභාර නොගෙවීම සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට විරුද්ධව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩුවට අදාලව 2019 දෙසැම්බර් 31 දින සිට රු.1,695,880 ක මුදලක් වාරික වශයෙන් ගෙවීම සඳහා නියෝග කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි සිදුකර අධිභාර ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) සංස්ථාව විසින් රු.8,153,155 ක වැට් මුදල් නොගෙවා පැහැර හැරීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩුව සඳහා කරුණු ඉදිරිපත් කිරීමට දින ලබා දී තිබුණු නමුත් එහි වර්තමාන තත්ත්වය විගණනයට පැහැදිලි නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යවස්ථාපිත ගෙවීම් පැහැර හැරීම සංස්ථාව විසින් නොකල යුතු අතර අධිකරණ ක්‍රියාමාර්ග වලට අනුකූලව කටයුතු කල යුතුයි. |
| (ඊ) සංස්ථාවේ ලොරි රථයක් අනතුරකට ලක්වීම හේතුවෙන් වෑන්රථයකට සිදුකල හානි සම්බන්ධයෙන් රු.500,000 ක වන්දියක්ද, නැවත රැකියාව සහ වැටුප් වන්දි වශයෙන් රු.6,516,871ක් ඉල්ලා සේවකයින් විසින් නඩු 08 ක්ද , පාරිතෝෂිත නොගෙවීම නිසා රු.2,378,795 ක වන්දි ඉල්ලා නඩු 2 ක්ද සේවක අර්ථසාධක අරමුදල් දායක හා අධිභාර නොගෙවීම නිසා රු.232,702,066 ක් ගෙවීම සඳහා නඩු 3 ක්ද රු.8,153,155 ක වැට් බදු නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නඩුවක්ද 2013 දෙසැම්බර් සිට 2015 ජනවාරි මස දක්වා කාලය තුල ලබාගත් මසුන් සඳහා මුදල් ගෙවීම පැහැර හැරීම නිසා රු.11,782,513 ක වන්දියක්ද ඉල්ලා සංස්ථාවට එරෙහිව මහේස්ත්‍රාත් හා දිසා අධිකරණ වලද කම්කරු විනිශ්චය සභා වලද නඩු පවරා තිබුණි.තවද 2019 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව සංස්ථාවට අයවිය යුතු මසුන් සඳහා හිඟමුදල් රු.17,514,049 ක් අයකර ගැනීම සඳහා නඩු 10 ක්ද පහරදීම සහ අලාභ අයකර | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 42 (අ) යටතේ වර්තමාන තත්ත්වය විගණනයට අනාවරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| ගැනීම සඳහා නඩු 02 ක්ද ඉඩම් පවරා ගැනීම සඳහා නඩුවක්ද බදුමුදල් රු.14,826,226 අයකර ගැනීම සඳහා නඩු 02ක්ද පවරා තිබුණි. එසේ වුවද මේ සම්බන්ධව වර්තමාන තත්වය විගණනයට අනාවරණය නොවීය. | | |
| (උ) සංස්ථාව විසින් මසුන් අලෙවි කිරීමේදී නියෝජිතයන් මාර්ගයෙන් රටතුල සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මසුන් අලෙවිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මත්ස්‍ය වෙළඳපොළෙහි මිල ස්ථායීකරණය කිරීමේ නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මත්ස්‍ය වෙළඳපොලෙහි මිල ස්ථායීකරණය කිරීමේ නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීම සංස්ථාවේ කර්තව්‍යයක් බැවින් ඒ සඳහාඅවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඌ) සංස්ථාව සතුව අධිශීතකරණ සහිත ලොරි රථ 50 ක් පැවති අතර ඉන් ලොරි රථ46 කම ශීතකරණ පද්ධතිය ක්‍රියාවිරහිතව තිබියදී මසුන් අලෙවිය සඳහා යොදවා ගෙන තිබුණි. මේ හේතුවෙන් හොඳ තත්වයේ මසුන් සාධාරණ මිලකට පාරිභෝගිකයාට ලබා දීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලොරි රථ වල ශීතකරණ පද්ධති ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට කටයුතු කල යුතුයි. |

2.6 කාර්යමණ්ඩල කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ කාර්ය මණ්ඩල තුල ප්‍රධාන තනතුරු 04 ක් වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(අලෙවි), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් සංවර්ධන හා පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) යන තනතුරු වැඩ බැලීම් සිදුකරන බව නිරීක්ෂණය විය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) වර්ෂ 03 කට අධික කාලයක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් මෙහෙයුම් දුර්වලතා, මෙහෙයුම් අකාර්යක්ෂමතා හා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ දුර්වල මෙහෙය වීම් නිරීක්ෂණය විය. | ප්‍රධාන තනතුරු පුරප්පාඩු වීම මත නව බඳවා ගැනීම් අවස්ථා ගණනාවකදී සිදුකරන ලද නමුදු එම නිළධාරීන් දිගුකාලීනව ආයතනය තුල රැඳී නොසිටීම මත මෙම පුරප්පාඩු නැවත නැවත ඇතිවීමේ තත්වයක් පවතී. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් දැනට බඳවාගෙන ඇති අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් සංවර්ධන හා සාමාන්‍යාධිකාරී බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම සිදුකර ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි තනතුරෙහි වැඩ බැලීම සඳහා මේ වන විටත් මීගමුව විධායක කළමනාකාර මහතා පත්කර ඇත. | පුරප්පාඩුව පවතින ප්‍රධාන තනතුරු වලට පත්වීම් කිරීමට කඩිනමින් කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2016 වර්ෂයේ සිට දීර්ඝ කාලීනව පුරප්පාඩුව පැවතීම, අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් අඛණ්ඩව සිදු නොකිරීම, සැලසුමක් නොමැතිව නිළධාරීන් විශ්‍රාම යැවීම, වැඩ බෙදීමේ ක්‍රමය අනුගමනය කිරීමද සිදුකර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණන නිළධාරී බඳවා ගෙන ඇත. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීම හා නිසි ක්‍රමවේදයන් අනුගමනය කර අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීමට කටයුතු කල යුතුය. |

3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අගෝස්තු 14 දිනැති අංක එස්ටී/එස්ටී/එම්ඩීපී/17 දරන රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට ලංකා ධීවර සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එසේ සංස්ථාව විසින් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද , ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ඉලක්ක මත ළඟා වීමට මැන බැලීමට දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කල යුතුයි. |